රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 33/2019

මගේ අංකය: MPubAd/AcSD/HB/61/SMA
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2019.11.08

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවට අංක 2137/66 හා 2019.08.22 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍ර මගින් ඇතුළත් කරනු ලැබූ සංශෝධනයන් ක්‍රියාත්මක කිරීම**

ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන(II) ශ්‍රේණියට සහ දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන (I) ශ්‍රේණියට උසස් කිරීමේ අවම සේවා කාලය සංශෝධනය කිරීමට අදාල විධිවිධාන ඇතුලත් කර අංක 2137/66 හා 2019 අගෝස්තු 22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ සේවා ව්‍යවස්ථාවේ පස්වන සේවා ව්‍යවස්ථා සංශෝධනය අනුව දැනට සේවයේ සිටින ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරීන්ගේ ශ්‍රේණි උසස් කිරීම් පහත පරිදි සිදුකරනු ලැබේ.

01. තුන්වන (III) ශ්‍රේණියේ සිට දෙවන(II) ශ්‍රේණියට උසස් කිරීම

1.1) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවාගෙන ඇති නිලධාරීන් සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (vii) යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - III පාඨමාලාව සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවය හැර 10.1.1.1 යටතේ සඳහන් අනෙකුත් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දිනය හෝ 2019 පෙබරවාරි 26 දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

1.2) සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 09 හි දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් නියමිත දිනට අනෙක් රාජ්‍ය භාෂා අවශ්‍යතාවය සම්පූර්ණ කරනු ලැබූ නිලධාරීන් ලෙස සළකනු ලැබේ.

1.3) සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 09 හි දක්වා ඇති අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ මගින් ලබා දී ඇති සහන කාලය තුල සම්පූර්ණ නොකරනු ලබන නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ඇතුලුව මෙම චක්‍රලේඛයේ 1.1 හි සඳහන් සියලුම සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

02. දෙවන (II) ශ්‍රේණියේ සිට පළමුවන(I) ශ්‍රේණියට උසස් කිරීම

2.1) සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන්ට සහ III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට

(අ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.2.1.1 හි අනු අංක v යටතේ සඳහන් 5 වැනි පරිශිෂ්ඨයේ සඳහන් කවර හෝ සුදුසුකමක් සම්පූර්ණ කරගැනීම සඳහා මෙම චක්‍රලේඛය ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට වසර පහ (05) ක කාල සීමාව සහන කාලයක් ලබාදෙනු ලබන අතර එම සහන කාලසීමාව තුළදී 5 වැනි පරිශිෂ්ඨයේ සඳහන් සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

(ආ) II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් වීම සඳහා ලබා තිබිය යුතු 10.2.1.1 හි අනු අංක ii යටතේ වන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කරගැනීම සඳහා II ශ්‍රේණියට උසස් කරනු ලැබූ දිනයේ සිට වසර තුන (03) ක සහන කාලයක් ලබාදෙනු ලබන අතර එම සහන කාල සීමාව තුළදී අදාල සුදුසුකම සම්පූර්ණ කරනු ලබන නිලධාරීන් මෙම චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන අනුව 10.2.1.1 යටතේ සඳහන් අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

2.2) සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට II ශ්‍රේණියේ සිටින නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1.1 හි (i) සහ (iv) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සළකා බලනු ලැබේ.

(අ) II ශ්‍රේණියේ වසර දෙක (02) ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා II ශ්‍රේණියට උසස්වීමෙන් පසු වැටුප් වර්ධක දෙක (02) ක් උපයාගෙන තිබීම

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව II ශ්‍රේණියට උසස්වීමෙන් පසු උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දෙක (02) ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම

2.3) සේවා ව්‍යවස්ථාවේ පස්වන සංශෝධනය ක්‍රියාත්මක වන 2019 පෙබරවාරි මස 26 දිනට III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.1 හි දක්වා ඇති විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලබන නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී 10.2.1.1 හි (i) සහ (iv) යටතේ සඳහන් කර ඇති සුදුසුකම් වෙනුවට පහත සුදුසුකම් සළකා බලනු ලැබේ.

(අ) III සහ II ශ්‍රේණිවල වසර දොළහ (12) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම වැටුප් වර්ධක එකොළහ (11) ක් උපයාගෙන තිබීම.

(ආ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර දොළහ (12)ක් තුල සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

**සටහන**

2019 පෙබරවාරි මස 26 දිනට පෙර ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ III වන ශ්‍රේණියේ වසර හය (06) කට වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති මෙම චක්‍රලේඛයේ 1.3 හි සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කරනු ලැබූ නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී එම නිලධාරීන් අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා ගනු ලැබූ අමතර කාලසීමාවට සමාන කාලසීමාවකින් එම නිලධාරීන්ගේ I ශ්‍රේණියට උසස් කිරීම ප්‍රමාද කරනු ලැබේ.

2.4) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවාගෙන ඇති මෙම චක්‍රලේඛයේ අනු අංක 1 යටතේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් කර ඇති නිලධාරීන් I ශ්‍රේණියට උසස් වීමට පෙර සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.1.1.1 හි අනු අංක (vii) යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - III පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකර සහතිකය ලබා තිබිය යුතුය.

2.5) 2019 පෙබරවාරි මස 26 දිනට පෙර සේවයට බඳවාගෙන ඇති නිලධාරීන් I ශ්‍රේණියට උසස් කිරීමේදී සංශෝධිත ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවා ව්‍යවස්ථාවේ 10.2.1.1 හි අනු අංක (vi) යටතේ සඳහන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් පවත්වනු ලබන හැකියා ප්‍රවර්ධන මට්ටම - II පාඨමාලාව සාර්ථකව සම්පූර්ණකර සහතිකය ලබා තිබීමේ අවශ්‍යතාවය සළකා බලනු නොලැබේ.

මෙම චක්‍රලේඛය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය අනුව නිකුත් කරනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය